# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය
### (බාහිර) - 2008

### සමාජීය විද්‍යා පීඨය

### පුස්තකාල හා විඥාපන විද්‍යාව - LISC - E2015

ග්‍රන්ථ විඥාපන පාලනය , සුචිකරණ න්‍යාය හා පරිචය

7 වන ප්‍රශ්නය ඇතුළුව මුළු ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි | කාලය : පැය 03 යි

---

01. (I) ග්‍රන්ථ විඥාපන පාලනය (bibliographic control) යන්න නිර්වචනය කරන්න. (ලකුණු 03)

(II) ග්‍රන්ථ විඥාපන පාලනය විෂයයෙහි පුස්තකාල සූචියෙන් ඉටුවන මෙහෙය සැකෙවින් දක්වන්න. (ලකුණු 07)

(III) ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සමුද්ධරණය කිරීමේ මෙවලමක් වශයෙන් පරිගණක සූචිය අනෙකුත් සියලුම සූචිවර්ගවලට වඩා කාර්යක්ෂම වන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

02. (I) වර්ෂ 1978 දක්වා ඇංග්ලෝ - ඇමරිකානු සුචිකරණ නීති සංග්‍රහ සම්ප්‍රදායයේ විකාශය සැකෙවින් දක්වන්න.

(ලකුණු 10)

(II) ඇංග්ලෝ- ඇමරිකානු සුචිකරණ නීති සංග්‍රහයේ දෙවැනි සංස්කරණයෙහි ඇති විශේෂතා කවරේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

03. (I) ප්‍රවේශන ශීර්ෂ (access points) යනු කවරේ ද යි සැකෙවින් දක්වන්න.

(ලකුණු 05)

(II) ප්‍රධාන ශීර්ෂ සංකල්පය (main entry concept) පැහැදිලි කොට පරිගණක සුචිකරණ පරිසරයකදී ප්‍රධාන ශීර්ෂ සංකල්පය කෙතෙක් දුරට අර්ථවත් වන්නේ ද යි නිදසුන් සහිතව විග්‍රහ කරන්න.

(ලකුණු 15)

04. සියර්ස් විෂය ශීර්ෂ ලැයිස්තුව පිළිබඳ අගැයුමක යෙදෙන්න.

(ලකුණු 20)

05. (I) විශ්ලේෂණ සුචිකරණය යනු කුමක්ද? (ලකුණු 05)

(II) විශ්ලේෂණ සුචිකරණයේ විවිධ මට්ටම් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 15)

06. ඇංග්ලෝ - ඇමරිකානු සුචිකරණ නීති සංග්‍රහයේ 2 සංස්කරණය අනුව ආයතන නාම ප්‍රධාන සංලේඛ ශීර්ෂ ලෙස භාවිත කළ යුතු අවස්ථා කවරේ ද යි නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 20)

07. අනිවාර්ය ප්‍රශ්නය

යට දැක්වෙන ග්‍රන්ථ විස්තර අනුව වර්ගීකෘත සුචියකට අවශ්‍ය සියලුම සංලේඛ පිළියෙල කරන්න. (ලකුණු 20)

මානව පුරාණය / පූර්ව ඓතිහාසික යුගවල සිට වර්තමානය දක්වා
මානව ශිෂ්ටාචාරයේ ඉතිහාසය / චාල්ස් සිංගල්ටන් සහ ජෙනී සිංගල්ටන්
රේඛා චිත්‍ර / ජේ. සී. ස්මිත්
සිංහල පරිවර්තනය / ජේ. කේ. වික්‍රමසූරිය
අර්ධ ග්‍රන්ථ නාම පිටුවේ ලෝකයේ ශිෂ්ටාචාර අංක 01 යැයි සඳහන් වේ. මුල් පිටු දහය රෝම ඉලක්කමින් ලකුණු කොට ඇත. එතැන් සිට 1 - 300 වශයෙන් අනෙකුත් පිටු අරාබි ඉලක්කමින් ලකුණු කොට තිබේ.
උස සෙන්ටි මීටර 20 කි.
ප්‍රකාශනය ගොඩගේ සහ සමාගම, කොළඹ.
1980/ මෙහි මුල් කෘතිය Story of the man: history of human civilization from pre-historic periods to present day / වර්ග අංක 909

***************************